(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 5(5).]

# පාර්ලිමේන්තුවේ අංක 5 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා**

## 2017 පෙබරවාරි මස 07 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ සීමාවන් ප්‍රතිශෝධනය කිරීම - 2016 (විෂය අංක - 01002),— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ සීමාවන් ප්‍රතිශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඒ අනුව, අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීමට අත්තිකාරම් ගෙවීම සඳහා ඇස්තමේන්තුවේ දැනට අනුමත සීමාවන් පහත පරිදි වන හෙයින්ද:—

| | | |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | - | රු. 150,000,000.00 |
| අවම ලැබීම් සීමාව | - | රු. 5,000,000.00 |
| උපරිම හර ශේෂ සීමාව | - | රු. 275,000,000.00 ; |

2016 වර්ෂ සඳහා මෙම වැටලීම් ගිණුමේ අපේක්ෂිත ශේෂ පහත පරිදි වන හෙයින්ද:—

| | | |
|---|---|---|
| 2016.01.01 දිනට හර ශේෂය | - | රු. 19,340,031.98 |
| වර්ෂය සඳහා අපේක්ෂිත හර | - | රු. 150,000,000.00 |
| වර්ෂය සඳහා අපේක්ෂිත බැර | - | රු. 1,700,000.00 |
| 2016.12.31 දිනට අපේක්ෂිත හර ශේෂය | - | රු. 167,640,031.98 ; සහ |

පූර්ව වර්ෂයන්හිදී පවරන ලද නඩු අවසන් නොවීම හේතුවෙන් නඩු භාණ්ඩ වශයෙන් රඳවා මුදල් බැර කළ නොහැකි වීම මත ලැබීම් හි අඩු වීමක් සිදුව ඇති හෙයින්ද;

ඊට අනුකූලව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ අවම ලැබීම් සීමාව රු.5,000,000.00 සිට රු.1,500,000.00 දක්වා අඩු කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝග,— ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 අධිකාරය වූ) 63 වගන්තියේ (2) උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්කර ගැනීමේ (වන්දි ගෙවීම්) නියෝගවල 4(2) නියෝගය සංශෝධනය කරමින් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 18 දිනැති අංක 1993/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 142 වගන්තිය යටතේ මිල ඉහළ සීමා සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ඔක්තෝබර් මස 21 දින අංක 1989/61 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 22(2) වගන්තිය යටතේ, ප්‍රති-අපනයනය කිරීම සඳහා හෝ තීරුබදු රහිත සාප්පුවල විදේශ ව්‍යාවහාර මුදලට විකිණීම සඳහා ආනයනය කරනු ලබන විදේශීය මත්පැන් මත සුරාබදු අය නොකිරීම සම්බන්ධයෙන් 2016 ඔක්තෝබර් මස 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 ඔක්තෝබර් මස 03 දිනැති අංක 1987/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 990 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ 3 උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ තීරුගාස්තු සම්බන්ධයෙන් 2017.01.24 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/26 දරන අති විශේෂ ගැසට් පත්‍රය.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග,— 2007 අංක 7 දරන සමාගම් පනතේ 477 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 527 වගන්තිය යටතේ සහ 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) සමඟ කියවිය යුතු (123 අධිකාරය වූ) 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 19 වගන්තිය යටතේ සමාගම් (ගාස්තු) සහ සමිති (ගාස්තු) සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ඔක්තෝබර් 25 දිනැති අංක 1990/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වන වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 නොවැම්බර් 11 දිනැති අංක 1992/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ යෝජිත ව්‍යාපෘතියට අදාළ නිදහස් කිරීම් සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 18 දිනැති අංක 1993/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.27 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වගන්තියේ 3 උප වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 30 දිනැති අංක 1999/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.27 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2017 මාර්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1060/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන නියෝජිතයන් නොවන ශ්‍රී ලාංකික පුරවැසියන්ට පෞද්ගලිකව පොලිස් ආරක්ෂාව ලබාදීමේ වැඩපිළිවෙළක් පොලිස් දෙපාර්තමේන්තුව සතුව තිබේද;

(ii) එසේ නම්, එසේ ආරක්ෂාව ලබා දී ඇති පුද්ගලයන් කවුරුන්ද;

(iii) ඔවුන්ට ලබාදී ඇති ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශපාලන පක්ෂවල ආසන සංවිධායකවරයන් සඳහා පොලිසියේ හෝ හමුදාවේ ආරක්ෂාව ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එසේ ආරක්ෂාව ලබා දී ඇති පුද්ගලයන් කවුරුන්ද;

(iii) ඔවුන්ට ලබා දී ඇති ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1095/’16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහනේ අරමුණු කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් වැඩසටහන සඳහා පුත්තලම දිස්ත්‍රික්කයෙන් තෝරාගත් ගම්මාන කවරේද;

(iii) එම එක් එක් ගම්මානයේ සංවර්ධනය සඳහා වැය කිරීමට අපේක්ෂා කරන මුදල කොපමණද;

(iv) එම වැඩසටහන යටතේ එක් ගමකට ලැබෙන සම්පත් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1110/’16

ගරු චමින්ද විජේසිරි මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල විවිධ සේවා සමූපාකාර සමිතියේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට එම විවිධ සේවා සමූපාකාර සමිතියේ ප්‍රාදේශීය සමිති අතරින් ලාභ උපයන හා පාඩු ලබන ප්‍රාදේශීය සමිති වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පසුගියදා පැවති නිලවරණය සම්බන්ධයෙන් යම් පැමිණිල්ලක් ලැබී තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1126/’16

ගරු විදුර වික්‍රමනායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ව්‍යවසායකයන් සවිබලගැන්වීම පිණිස සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා ක්ෂුද්‍ර කර්මාන්ත සඳහා සහන පොලී පදනමක් මත, වසර දෙකක සහන කාලයක්ද සහිතව SMILE III ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලද බවත්;

(ii) ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2016 ජූලි මස 10 වැනි දින පුවත්පත් දැන්වීම් පළකර, ණය ලබාදීම පිළිබඳව ප්‍රචාරය කරන ලද බවත්;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීමට වාණිජ බැංකු දහයක් ඉදිරිපත් වූ අතර, ණය අයදුම්කරුවන් පන්දහසක් පමණ එම ණය අපේක්ෂාවෙන් ඉදිරිපත් වුවද ණය ලබාදීම නවතා ඇති බවත්;

(iv) බොහෝ ව්‍යවසායකයන් විසින් අවශ්‍ය මූලික වියදම් දරමින් ඇප ඔප්පු අත්සන් කිරීම සහ උගස් ඔප්පු සකස් කිරීම වැනි කටයුතු අවසන්කර ඇතත්, ණය ලබාදී නොමැති බවත්;

(v) මෙම තත්ත්වය හේතුවෙන් නව ව්‍යාපාර සහ වැඩිදියුණු කිරීම් ව්‍යාපාර අතරමඟ නැවතී ඇති අතර එය ජාතික ආර්ථිකයටද බලවත් පහරක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ණය මුදල් ලබාදීමට හැකියාවක් නොමැති නම්, 2016.07.10 දින පුවත්පත් දැන්වීම් ප්‍රචාරය කර ජනතාව අපහසුතාවයට පත් කරන ලද්දේ මන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1127/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජය විසින් රු. 350/- පොහොර සහනාධාරය ලබාදීමේදී පොහොර මිටියකට, අතිරේක රු. 150/- ක මුදලක් අයකර, "කෙතට අරුණ වැඩසටහන" යටතේ නියඟය, ගංවතුර හා වල් අලි උවදුරු වෙනුවෙන් රු. 10,000/- ක උපරිමයකට යටත්ව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා වන්දියක් ගෙවූ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) වර්තමානයේ මුළු දිවයිනටම බලපා ඇති දරුණු නියඟයෙන් විපතට පත්වූ අයට රක්ෂණ වන්දි මුදලක් ලබාදෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද ?

1276/'16

ගරු කාංචන විජේසේකර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විදේශ විනිමය ඉපයීමට සහ ජනතාවගේ පෝෂණ අවශ්‍යතාවයන් සපුරාලීමෙහිලා දායකත්වයක් ලබාදෙන ධීවර කර්මාන්තයේ අඛණ්ඩ පැවැත්ම පිළිගන්නෙහිද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මාතර දිස්ත්‍රික්කයේ,

(i) ධීවර වරායන්, නැංගුරම් තොටුපළ සංඛ්‍යාව සහ ඒවා පිහිටි ස්ථාන;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව ලියාපදිංචි බහු දින හා එක් දින ධීවර යාත්‍රා සංඛ්‍යාව;

(iii) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනයන්ට අනුව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවත්වන ධීවරයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ,

(i) ධීවර යටිතල පහසුකම් නැංවීම සඳහා වැය කරනු ලැබූ මුදල් ප්‍රමාණය;

(ii) සහනාධාර පදනම මත බෙදා දී ඇති බහු දින සහ එක් දින යාත්‍රා සංඛ්‍යාව;

(iii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, සහනාධාර පදනම මත බෙදා දී ඇති ධීවර ආම්පන්න කට්ටල, පණිවුඩ හුවමාරු යන්ත්‍ර සහ ජීවිත ආරක්ෂක කබා ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1373/’16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 126 යෝජනාවට අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ අලෙවි ප්‍රවර්ධනය සඳහා පෞද්ගලික අංශයේ සුපිරි වෙළඳසැල්වල රාක්ක ඉඩකඩ සාධාරණ මිලකට ලබා දෙනු ලැබුවේද;

(ii) පෞද්ගලික අංශයේ සුපිරි වෙළඳ සැල්වලින් එකී රාක්ක ඉඩකඩ වෙන් කර දෙන ලෙසට කිසියම් අමාත්‍යාංශයක් විසින් ඉල්ලීමක් කරනු ලැබුවේද;

(iii) එසේ ඉල්ලීමක් හෝ නියෝගයක් කරනු ලැබුවේ නම්, එහි පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(iv) ශ්‍රී ලංකාව තුළ පිහිටි බදු අය කරනු ලබන පෞද්ගලික අංශයෙහි සුපිරි වෙළඳසැල් සංඛ්‍යාව සහ ඒවා පිහිටා ඇති නගර/ග්‍රාමයන් පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## **2017 මාර්තු මස 10 වැනි සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

966/’16

ගරු බිමල් රත්නායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 - 2016 දක්වා කාලය තුළ,

(i) ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති රසායනික පොහොර ප්‍රමාණය;

(ii) එක් එක් කන්නය සඳහා රජය මඟින් නිකුත් කර ඇති රසායනික පොහොර ප්‍රමාණය;

(iii) වී වගාව සහ එළවළු වගාව සඳහා නිකුත්කර ඇති රසායනික පොහොර ප්‍රමාණය;

(iv) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර ප්‍රමාණය;

(v) එක් එක් කන්නය සඳහා රජය මඟින් නිකුත් කරන ලද කාබනික පොහොර ප්‍රමාණය;

(vi) වී වගාවට සහ එළවළු වගාවට නිකුත්කර ඇති කාබනික පොහොර ප්‍රමාණය;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

996/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 සහ 2015 වසරවලදී ශ්‍රී ලංකා රජයට විදේශීය රාජ්‍යයන්ගෙන් සහ ජාත්‍යන්තර ආයතනයන්ගෙන් ලැබුණු ප්‍රදාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2014 වසරට සාපේක්ෂව, 2015 වසරේදී ලැබුණු විදේශීය ප්‍රදාන පහත වැටී තිබේද;

(iii) එසේ නම්, ජාත්‍යන්තර ප්‍රජාව දිනා ගත් බැව් පවසන ආණ්ඩුවක් තිබියදී, විදේශ ප්‍රදාන පහත වැටීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1102’/16

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව, නාවට්කර්නි කන්නකි විද්‍යාලයේ ගුරුවරියක වන නලිනගාන්ධි විමලේන්ද්‍රන් මහත්මිය, 2008 දී මඩකලපුව ගුරු විද්‍යාලයෙන් සිය පුහුණුව අවසන් කළ බවත් මුලතිව් දිස්ත්‍රික්කයේ කයිවෙලි ගනේෂා විද්‍යාලයට පත්කළ බවත්;

(ii) 2009 අප්‍රේල් මස පැවති මඩකලපුව ගුරු විද්‍යාලයේ අවසන් පරීක්ෂණයට පෙනී සිටින ලෙසට ඇයට දැනුම් දීමක් කෙරුණු බවත්;

(iii) එම කාලසීමාවේ දී යුද්ධය උච්චතම අවස්ථාවට එළඹ තිබූ බැවින් කිසිදු පුද්ගලයෙකුට මුලතිව්වලින් පිටවීමට අවසර නොතිබූ බවත්;

(iv) ඇය සිය කණිෂ්ඨ කණ්ඩායම සමඟ පරීක්ෂණයට පෙනී සිටි බවත්; 2011.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි ඇගේ සහතිකය නිකුත් කර ඇති බවත් ඇගේ කණිෂ්ඨයින්ට එම දිනය 2009.08.01 බවත්;

(v) ඇය මේ අසාධාරණය පිළිබඳව ජනාධිපතිතුමාට අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්; මෙම විෂමතාව නිවැරදි කිරීම සඳහා ජනාධිපතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා 2016.08.05 දිනැති SL/EDU/APP/0043 අංක දරන ලිපිය එවකට, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) ඇගේ සහතිකයේ බලාත්මක දිනය 2009.08.01 ලෙස වෙනස් කිරීමට උපදෙස් ලබා දෙන්නේද යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1112/’16

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, අධිකාරි, සංස්ථා හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනයේ සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු, ඉහත එක් එක් ආයතනය සඳහා බඳවා ගත් මුළු සේවක සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) දැනට මෙම ආයතනවල සේවක පුරප්පාඩු පවතීද;

(vi) එසේ නම්, ඉදිරියේදී සේවකයන් බඳවා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1128/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාත් සභාවේ වර්තමාන මහ ඇමතිවරයා එම තනතුරට පත්වීමෙන් පසු සිදු කර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කළ රටවල් සහ එම සංචාර සඳහා වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් රටවල සංචාරය කළ අරමුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එකී විදේශ සංචාරවලින් අපේක්ෂිත අරමුණු සම්බන්ධයෙන් ලබාගත් ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1132/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ආයෝජන පෞද්ගලික සමාගමට උසස් අධ්‍යාපන ආයතනයක් ඇරඹීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අවසරය ලබාදී තිබේද;

(ii) එසේ නම්, ඒ කවර උපාධි ලබාදීම සඳහාද;

(iii) එම ආයතනය සමඟ ගිවිසුම්ගත වූ දිනය කවරේද;

(iv) එම ගිවිසුම සභාගත කරන්නේද;

(v) ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය උපාධිය හා සෞඛ්‍ය විද්‍යා උපාධිය පිරිනැමීමට අනුමතිය ලබාදීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ පූර්ව අවසරය ලබාගත යුතු බවට වන කොන්දේසිය, ඉහත කී සමාගම සපුරා තිබේද;

(vi) එසේ නම්, සෞඛ්‍ය අමාත්‍යාංශය එම අවසරය ලබාදුන් ලිපිය සභාගත කරන්නේද;

(vii) නොඑසේ නම්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇති වූ එකඟතාවය කඩ කරන ලද එම සමාගමට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1345/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමට A350 වර්ගයේ ගුවන් යානා 3ක් ගෙවීමේ ක්‍රමයට විදේශීය සමාගමකින් ඇණවුම් කර තිබූ බවත්;

(ii) නව රජය බලයට පත්වීමෙන් පසු එම ඇණවුම අවලංගු කළ බවත්;

(iii) ඇණවුම භාරගත් AerCap සමාගම ගිවිසුම අවලංගු කිරීම සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 97 ක වන්දි මුදලක් ඉල්ලා සිටි බවත්;

(iv) ගුවන් යානා මිලදී නොගන්නේ නම්, ඒවා වෙනත් ගුවන් සමාගමකට විකිණීමේ හැකියාව තිබියදී, කැබිනට් මණ්ඩලය නොමග යවා වන්දි ගෙවීම පිළිබඳ සාකච්ඡා කිරීමට 2016.09.07 දින කැබිනට් අනුකාරක සභාව විසින් තීරණයක් ගෙන ඇති බවත්;

(v) එම ගුවන් යානා වෙනත් ගුවන් සමාගමකට විකිණීම හෝ AerCap සමාගම විසින් ඉල්ලා ඇති වන්දි මුදල අඩු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා නොකර සහ කැබිනට් අනුමතියකින් තොරව චරිත රත්වත්තේ මහතා විසින් එවන ලද ඊමේල් පණිවිඩයකට අනුව එම මුදල ගෙවීමට අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එමගින් ශ්‍රී ලංකා රජයට සිදුවූ පාඩුව හා ආර්ථික හානිය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1351/’16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දුම්රිය දෙපාර්තමේන්තුව සතු මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් නගරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)හි සඳහන් මුළු ඉඩම් ප්‍රමාණයෙන් බදු පදනම යටතේ හෝ අන් කවර හෝ පදනමක් යටතේ මේ වනවිට දෙපාර්තමේන්තු භාවිතයෙන් ඉවත්ව ඇති ඉඩම් වලට අදාළ,

(i) වපසරිය;

(ii) භූගෝලීය බලප්‍රදේශය;

(iii) පදනම;

(iv) දෙපාර්තමේන්තු භාවිතයෙන් ඉවත් වූ දිනය;

අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු දීමට, විකිණීමට හෝ දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර කිරීම සඳහා මේ වනවිට කිසියම් තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් කවරේද;

(iii) අදාළ ඉඩම් බැහැර කිරීමේ පදනම කවරේද;

(iv) බදු පදනම යටතේ බැහැර කොට ඇති ඉඩම් පර්චස් එකක් සඳහා දැනට අය කෙරෙන මාසික බදු මුදල කොපමණද;

(v) බදු ගෙවීම පැහැර හැර ඇති ඉඩම් සංඛ්‍යාව කොපමණද;

(vi) බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ සඳහා ගනු ලබන නෛතික පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1375/’16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 129ට අනුව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මනා සහයෝගීතාවය දිරිගැන්වීම සඳහා රුපියල් මිලියන 1000 ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබූ එකී රුපියල් මිලියන 1000 උපයෝජනය කළ ආකාරය කවරේද;

(iii) අයවැය යෝජනා මඟින් වෙන් කළ එකී රුපියල් මිලියන 1000 ක මූල්‍ය සම්පත්වල ප්‍රතිලාභීන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

999/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වසරේදී රජයට භාර වූ හෝ අත්අඩංගුවට ගත් බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගෙන් පුනරුත්ථාපනය කර සමීප ඥාතීන්ට භාර දුන් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙතෙක් සමීප ඥාතීන්ට භාර නොදුන් අය සිටිත් නම්, ඔවුන් රඳවා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1399/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 171 වැනි යෝජනාවට අනුව, ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ වැඩසටහන සඳහා, එක් ගමකට රුපියල් මිලියන 1.5 දක්වා, වෙන් කර දුන්, රුපියල් මිලියන 21,000ක ප්‍රතිපාදනය 2016 වර්ෂය තුළදී බෙදා දුන් ගම්මාන සහ එම එක් එක් ගම්මානයෙහි නිමකළ ව්‍යාපෘති පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) එකී ග්‍රාමසේවක වසම් 14022හි උක්ත අයවැය යෝජනාව ක්‍රියාත්මක කළ බලධාරි ආයතන සහ එම බලධාරින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2016 වසර තුළදී ලබාගෙන ඇති මුදල් ප්‍රමාණයන් දැක්වෙන ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) උක්ත අයවැය යෝජනාවට අනුව, එක් ගමකට රුපියල් මිලියන 1.5 බැගින් වූ මූල්‍ය ප්‍රතිපාදන ලබා නොගත් හෝ ඉන් කොටසක් පමණක් ලබා ගත් ග්‍රාම නිලධාරි කොට්ඨාස ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
### (2017 මාර්තු මස 10 වැනි සිකුරාදා)

925/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පියදාස කුඩා බාලගේ නමැත්තා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හා ඊට අනුබද්ධ ආයතනවල දැරූ තනතුරු කවරේද;

(ii) එම තනතුරු දරන ලද කාල සීමාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) ඔහු එක් එක් තනතුර සඳහා ලබාගත් මාසික වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 මාර්තු මස 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

841/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, කොච්චිකඩේ, ශාන්ත අන්තෝනි දේවස්ථානය, මාතර අප ස්වාමි දුවගේ දේවස්ථානය, මඩු දේවස්ථානය හා රාගම බැසිලිකා යන දේවස්ථාන ශ්‍රී ලාංකික ක්‍රිස්තියානි හා කතෝලික බැතිමතුන්ගේ ප්‍රධාන පූජනීය ස්ථාන බවත්;

(ii) මෙම පූජනීය ස්ථානයන්ට පැමිණෙන බැතිමතුන්ට අවශ්‍ය වන පොදු පහසුකම් අවම මට්ටමක පවතින බවත්;

(iii) ඒ හේතුවෙන් මෙම පූජනීය ස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික උත්සව අවස්ථාවලදී බැතිමතුන් මහත් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම පූජනීය ස්ථාන සංවර්ධනයට රජය පියවර ගෙන තිබේද;

(ii) වාර්ෂික උත්සව සඳහා රජය ලබා දෙන මූල්‍ය පහසුකම් ඇතුළු වෙනත් ආධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

976/'16

ගරු බිමල් රත්නායක මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ, හලාවත, ඉරණවිල ප්‍රදේශයේ "ඇමරිකන් හඬ" (Voice of America) යනුවෙන් සම්ප්‍රේෂණාගාරයක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම ලබා දී ඇත්තේ සින්නක්කරද; එසේ නැතහොත්, බදු පදනම මතද;

(iv) බදු පදනම මත නම්, ශ්‍රී ලංකා රජයට ලබාදී ඇති බදු ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙම භූමිය තුළ ශ්‍රී ලංකා රජයේ සියලුම නීති රීති බලාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "ඇමරිකන් හඬ" ආයතනය ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රජය සහ ඇමරිකා එක්සත් ජනපද රජය හෝ "Voice of America" ආයතනය සමඟ එළඹී ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් සියල්ලම සභාගත කරන්නේද;

(iii) එම ආයතනය තුළ සේවය කරන ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතනය විසින් කරනු ලබන වැඩකටයුතු සහ විකාශනය කරනු ලබන වැඩසටහන් කවරේද;

(v) එම වැඩකටයුතු හා වැඩසටහන් නියාමනය කරනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1008/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ආරක්ෂාවට සහ ප්‍රජාතන්ත්‍රවාදයට අනතුරක් බැවින්, ප්‍රමුඛතා පදනමින් විමර්ශනය කරන මෙන් ඉල්ලමින් විදේශ අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා විසින් 2015.01.08 වැනි දින රාත්‍රියේ ජනාධිපතිවරණ ප්‍රතිඵල අත්හිටුවීමේ කුමන්ත්‍රණයක් පිළිබඳව, 2015.01.14 වැනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්;

(ii) ඒ පිළිබඳව මවිසින් ඉදිරිපත් කළ පාර්ලිමේන්තු වාචික ප්‍රශ්නයකට 2016.03.09 වැනි දින පිළිතුරු දෙමින් නීතිය සහ සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයා විසින් නීතිපති උපදෙස් නොලැබීමෙන් ඉදිරි කටයුතු ඇණහිට ඇතැයි පැවසූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එකී විමර්ශනය පිළිබඳ වාර්තාවක් නීතිපතිවරයාට ලැබුණු දිනය කවරේද;

(ii) එකී විමර්ශනය පිළිබඳ නීතිපති උපදෙස් පොලිසියට යැවූ දිනය කවරේද;

(iii) නීතිපති උපදෙස් මේ වනතෙක් යවා නොමැති නම්, ඊට බල පෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1101/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08න් පසුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත නිවාස ඉදිකිරීමේදී නිවාස ණය ලෙස ලබා දී ඇති මුදල කොපමණද;

(iv) එම නිවාස ණය, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.01.08 න් පසුව අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති ආධාරලාභී නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(iv) එම මුදල, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015.01.08 න් පසුව අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති නිවාස ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(iv) එම මුදල, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1400/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 172 යෝජනාවට අනුව, වවුනියාවෙහි නව ආර්ථික කලාපයක් ඇති කිරීමට වෙන් කරන ලද රුපියල් මිලියන 200ක ප්‍රතිපාදනය 2016 වර්ෂය තුළ වැය කළ ආකාරය පිළිබඳ සවිස්තරාත්මක වැය ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට වෙන් කර දුන් එම මුදලින් 2016.03.31 දිනට පෙර එම අමාත්‍යාංශය වෙත මුදා හරින ලද මුදල කොපමණද;

(iii) උක්ත ආර්ථික කලාපය සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරනු ලබන අවස්ථාවේදී හෝ ඉන්පසුව මෙම ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතා වාර්තාවක් සකසනු ලැබුවේද;

(iv) එසේ නම්, එය ඉදිරිපත් කරන්නේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

(vi) 2016 වර්ෂය තුළදී මෙම වැදගත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට, අදාළ පළාත් සභාවෙන් පූර්ණ අනුග්‍රහයක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

842/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශය වන කෝපි කඩේ ටෙලි නාට්‍ය මාලාව දකුණු ආසියාවේ දීර්ඝතම ටෙලිනාට්‍ය මාලාව බවත්;

(ii) එය මේ වනතෙක් නිසි ඇගයීමකට ලක්වී නොමැති බවත්;

(iii) එම තත්ත්වය එහි රංගනයෙන් හා අනෙකුත් අංශයන්ගෙන් දායකවන ශිල්පීන්ට සිදුවන අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කෝපි කඩේ නාට්‍යමාලාවේ, ආරම්භයේ සිට, වසර 20-30ත් අතර, වසර 10-20ත් අතර හා වසර 5කට වැඩි ආදී වශයෙන් රංගනයෙන් හා අනිකුත් තාක්ෂණික ක්ෂේත්‍රයන්ගෙන් දායකවන ශිල්පීන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) රජය හෝ ස්වාධීන රූපවාහිනී සේවය එම ශිල්පීන්ගේ සුභසාධනය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) උක්ත ශිල්පීන් ඇගයීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1011/'16

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට දිවයිනේ සියළුම ප්‍රදේශවල පාසල් සිසුන් ප්‍රවාහනය සඳහා පුද්ගලික වෑන් රථ සහ ත්‍රිරෝද රථ විශාල වශයෙන් යොදා ගන්නා බවත්;

(ii) පාසල් නිවාඩු කාලයේද වෑන් රථ සඳහා ගාස්තු අය කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට දිවයිනෙහි පාසල් සිසුන් ප්‍රවාහනය සඳහා යොදවා ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම වෑන් රථවල ප්‍රමිතිය, රථයක තිබිය යුතු ආසන සංඛ්‍යාව සහ වෑන් රථ සඳහා පාසල් සිසුන්ගෙන් අයකරනු ලබන ගාස්තුව ආදී කරුණු සම්බන්ධයෙන් කිසියම් නියාමනයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1042/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිටපු ජනාධිපතිනි, චන්ද්‍රිකා කුමාරණතුංග මැතිණිය වත්මන් ආණ්ඩුවේ යම් නිලයක් දරන්නේද;

(ii) එතුමියට සංහිඳියාව පිළිබඳ කිසියම් වගකීමක් පවරා තිබේද;

(iii) ඇයට රජයේ වියදමින් හෙලිකොප්ටර් මඟින් ප්‍රවාහන පහසුකම් ලබා දී තිබේද;

(iv) එතුමියට ලබා දී ඇති වාහන සංඛ්‍යාව, ආරක්ෂකයන් සංඛ්‍යාව සහ වෙනත් පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1407/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 183 වැනි යෝජනාවට අනුව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි, පිහිටුවීමට යෝජනා කරන ලද විශේෂිත කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාපවලින්, 2016 වර්ෂය තුළ පිහිටවනු ලැබූ කලාප සංඛ්‍යාව සහ ඒවා පිහිටවූ ස්ථාන කවරේද;

(ii) උක්ත යෝජනාවට අනුව පිහිටවූ එක් එක් කලාපයක් වෙනුවෙන් රජය විසින් දරනු ලැබූ මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාපයන්හි වගකීම දරන්නේ කවර රාජ්‍ය ආයතනයක් විසින්ද;

(iv) 2016 වර්ෂය තුළ එවැනි කලාප පිහිටවනු ලැබුවේ නම්, එම එක් එක් කලාපයක අපනයන ඉපයුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

709/'16

ගරු එස්. වියාලේන්දිරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 2015 ජනවාරි 8 වැනි දා සිට හඳුන්වා දෙන ලද "දින 100" වැඩසටහන ආරම්භයේ සිට අද දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ සුළු සේවක පත්වීම් ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පත්වීම් ලබාදීමේදී සලකා බැලූ සුදුසුකම් කවරේද;

(ii) එලෙස පත්වීම් කොපමණ සංඛ්‍යාවක් ලබා දී තිබේද;

(iii) එම පත්වීම් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පත්වීම් ලබා දී ඇති දෙමළ ජාතික සුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

723/'16

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය ණයබරතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මුළු ණයබරතාවය ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම ප්‍රතිශතය 2004 වර්ෂය වනවිට තිබූ ණයබරතාවයේ ප්‍රතිශතයට වඩා අඩු අගයක්ද; නැතිනම් වැඩි අගයක්ද;

(iv) එම ණය ගෙවීමට රජය යෝජනා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෑතක සිට එම ණයබරතාවය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් මෙරට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම දැන්වීම් ප්‍රචාරය කිරීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනී මාධ්‍යයන්ට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රාජ්‍ය හා පෞද්ගලික ගුවන් විදුලි මාධ්‍යයන්ට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිනපතා හා සති අන්ත පුවත්පත් සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

828/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) හිඟුරාන සීනි කම්හලට අයත් ඉඩම්වල උක් වගා නොකරන කාලවලදී සහ උක් වගා නොකරන කොටස්වල විකල්ප බෝගයක් ලෙස වී වගාව කළ හැකි බව පිළිගන්නේද;

(ii) සීනි කර්මාන්තයට කිසිදු හානියක් සිදු නොවන ලෙස නුරුච්චෝල යායේ සහ දීඝවාපී කලාපයේ වී වගා කිරීමට පියවර ගත හැකි බව නිරීක්ෂණය කර තිබේද;

(iii) දැනට හිඟුරාන සීනි සමාගම කළමනාකරණය කරනු ලබන ගල්ඔය වැවිලි සමාගම විසින් උක් වගාව හැර වී වගාව හෝ වෙනත් වගාවක් සිදු කරන ගොවීන්ගේ ඉඩම් යළි අත් කර ගන්නා බවට ලිපි එවා ඇති බව දන්නේද;

(iv) උක් වගාවට හානි නොවන ලෙස වී වගා කරන ගොවීන්ගේ ඉඩම් ආරක්ෂා කර දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාවට නගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

931/'16

ගරු චන්දිම ගමගේ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමේදී ටෙන්ඩර් කාර්ය පටිපාටිය අනුගමනය කළයුතු බව විදුලිබල පනතේ සඳහන්ව ඇති බව දන්නේද;

(ii) මේ වනතෙක් සිදු කර ඇති විදුලිය මිලදී ගැනීම් සඳහා ටෙන්ඩර් කාර්ය පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවර අවස්ථාවලදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

937/'16

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දුම් රහිත දර උඳුන් භාවිතය ප්‍රචලිත කිරීම සඳහා විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා මෙතෙක් සිදුකර ඇති ආයෝජනය කොපමණද;

(iii) ජනතාවට වාණිජ මට්ටමින් ඉන්ධන දැව ලබා දීම ප්‍රවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

(iv) ඉන්ධන දැව වගා කිරීමේ ව්‍යාපෘති යටතේ, ශාක වගා කර ඇති බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

948/'16

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීමෙන් පසු තලාව, තඹුත්තේගම, ගල්නෑව හා ඉපලෝගම යන ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල සුසාන භූමි සඳහා වෙන් වූ භූමි භාගයන් ක්‍රමයෙන් අඩු වූ බවත්;

(ii) ඊට පිළියමක් ලෙස එම ප්‍රදේශ වෙනුවෙන් ආදාහනාගාරයක් ඉදිකර දෙන ලෙස ජනතාව ඔබ අමාත්‍යාංශයෙන් දීර්ඝ කාලයක් ඉල්ලීම් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉල්ලීම ඉටුකිරීම සඳහා, 2014 වර්ෂය සඳහා කලාවැව ආසනයේ සංවර්ධනය සඳහා වෙන්වූ ප්‍රතිපාදනවලින්, එප්පාවල සුසාන භූමියේ ආදාහනාගාරයක් ඉදිකිරීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආදාහනාගාරය ඉදිකිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) එහි ඉදිකිරීම් අතරමග නතර කර ඇත්තේ මන්ද;

(iv) එහි ඉදිකිරීම් සම්පූර්ණ කර ජනතා අයිතියට පත් කරන දිනය කවදාද;
යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?